Australian Government
Department of Immigration
and Border Protection

# මාධ්‍ය නිවේදනය (Media release)

## ඕස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව අතර මිනිස් ජාවාරමට එරෙහිව ඇති සහයෝගීතාව ශක්තිමත් කර ගනී

**13 සැප්තැම්බර 2017**

ඕස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුමක් (Memorandum of Understanding (MOU)) ඇතිකර ගැනීම මගින් කලාපයේ මිනිස් ජාවාරම්කරුවන් හට පහරක් එල්ල කරන ලදී. මේ මගින් මෙම රටවල් දෙක අතර මිනිස් ජාවාරමට එරෙහිව තව දුරටත් සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට ඉඩකඩ ලැබෙනු ඇත.

MOU මගින් මිනිස් ජාවාරම් කටයුතුවල නිරතවන අයව ශ්‍රී ලංකාවට නැවත යැවීමට ඉඩකඩ ලබාදේ. මේ මගින් මිනිස් ජාවාරම්කරුවන් ලුහුබැඳීම, අතරමගදී නැවැත්වීම සහ විමර්ශනය කරන ක්‍රම සම්බන්ධ තොරතුරු බොදාහදා ගැනීම වැඩි කර ගැනීමටද ඉඩකඩ ලබාදේ.

මෙම MOU සඳහා කැන්බරාහිදී පැවති උත්සවයකදී සංක්‍රමණ සහ දේශසීමා ආරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලේකම් (Department of Immigration and Border Protection Secretary) Michael Pezzullo සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලේකම් (Sri Lankan Secretary for Defence) Kapila Mudantha Waidyaratne විසින් අත්සන් තබන ලදී.

මිනිස් ජාවාරමට එරෙහිව කටයුතු කිරීම සහ නීතිවිරෝධී ආකාරයට බෝට්ටුවලින් ඕස්ට්‍රේලියාව වෙත එන ගමනේදි මිනිසුන් සිය ජීවිත අවදානමට තබා ගැනීම වැළැක්වීම සම්බන්ධ ඕස්ට්‍රේලියානු බහු ආකාර ප්‍රවේශය සම්න්ධයෙන් ශ්‍රී ලංකාව ඇතුළු ජාත්‍යන්තර හවුල්කරුවන් සමග ශක්තිමත් සහ සහයෝගීතා සම්බන්ධතාවයක් තිබීම වැදගත්වේ.

2013 දී ස්වාධිපත්‍ය දේශසීමා මෙහෙයුම (Operation Sovereign Borders) ආරම්භවුණු පසු, ශ්‍රී ලංකාවේ සිට ඕස්ට්‍රේලියාව වෙත මිනිස්ජාවාරම් කිරීමට ගත් සෑම උත්සාහයක්ම ව්‍යර්ථවී ඇත. මෙම MOU මගින් පැහැදිලි වන්නේ මෙහි සාර්ථකත්වය දිගටම පවත්වා ගැනීමට රටවල් දෙකම බලා සිටින බවයි.

මෙම ගිවිසුම මගින් රටවල් දෙක අතර මිනිස් ජාවාරමට එරෙහිව කටයුතු කිරීම, නීතිවිරෝධී භාණ්ඩ එහා මෙහා යාම නැවැත්වීම සහ කළු සල්ලි ජාවාරම ඉලක්ක කිරීම සහ අපරාධවලින් හම්බකරන මුදල් සම්බන්ධ සහයෝගීතාව තවදුරටත් වැඩිකෙරේ.

ඕස්ට්‍රේලියාවේ සහ ශ්‍රී ලංකාවේ පුහුණුවීම් සහ සහයෝගීතාව මගින් ඒජන්සි දෙකෙහිම නිලධාරීන් හට මෙම ක්ෂේත්‍රවල නිපුණතා ශක්තිමත් කර ගැනීමට සහ වඩා සමීපව කටයුතු කිරීමට අවස්ථාව ලබාදේ.

මිනිස් ජාවාරම සහ වෙනත් ජාත්‍යන්තර අපරාධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමග සහයෝගයෙන් කටයුතු කිරීමට ඕස්ට්‍රේලියාව සතුව දිගු ඉතිහාසයක් ඇති අති අතර එම සහයෝගීතාව දිගටම පවත්වා ගැනීමට අඩිතාලම තබා ඇති අතර, එය තවදුරටත් වර්ධනය වනු ඇත.

**මාධ්‍ය සම්බන්ධතා:** සංක්‍රමණ සහ දේශසීමා ආරක්ෂණ (Immigration and Border Protection) (02) 6264 2244

සංක්‍රමණ සහ දේශසීමා ආරක්ෂණ ලේකම් (Immigration and Border Protection Secretary), Michael Pezzullo සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂණ ලේකම් (Sri Lankan Secretary for Defence) Kapila Mudantha Waidyaratne විසින් මිනිස් ජාවාරමට එරෙහිව කටයුතු කිරීමට නව MOU එකක් අත්සන් තබන ලදී